**ශීර්ෂය 104 - ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 අගෝස්තු 15 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 අගෝස්තු 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින්, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මග හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි. ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ සැසඳීමක් කළ නොහැක. තවද, ඒ හේතුවෙන්ම ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශද මෙම වාර්තාවෙන් ඉදිරිපත් කර නැත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) චක්‍රලේඛයේ 3.2 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ආදායම්, වියදම් හා අනෙකුත් ප්‍රධාන ලෙජර ශේෂයන්හි අගය ආසන්න රුපියලට වාර්තා කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවීම. | ඉදිරි මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී වටිනාකම ආසන්න රුපියලට ගණනය කර මූල්‍ය ප්‍රකාශනය සැකසීමට කටයුතු කරන බව. |
| (ආ) චක්‍රලේඛයේ **6** ඡේදය ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ආරම්භක ශේෂය හා වර්ෂය තුල මිලදි ගෙන තිබුණු වත්කම් වර්ගීකරණය කර ඉදිරිපත් කර නොතිබුණි. | -එම- | අදහස් දක්වා නොමැත |
| (ඇ) චක්‍රලේඛයේ **7(VI)** ඡේදය ප්‍රකාරව අක් මුදල් ගැලපීම් ගිණුමක් පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත්කර නොතිබුණි. | -එම- | -එම- |

**1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2017 වර්ෂයේදී අත්පත් කර ගෙන තිබුණු රු.මිලියන 148.8 ක් වු වාහන සමාලෝචිත වර්ෂයේ මිලදීගැනීම් ලෙස දක්වා තිබුණි. | පවරා ගැනීම් සිදු කළ වර්ෂයේදීම නිවැරදි ව ගිණුම් ගත කළ යුතුවීම. | මෙම අමාත්‍යාංශයට ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවෙන් 2017 හා 2018 වර්ෂවලදී පවරන ලද වාහන බව. |
| (ආ) සේවක අර්ථසාධක අරමුදලට පරිගණක ලබාගැනිමට ලබාදී තිබුණු රු.මිලියන 10 ක් අමාත්‍යාංශයේ කාර්යාලීය උපකරණ ආරම්භක ශේෂය තුල දක්වා තිබුණි. | අමාත්‍යාංශයට අයත් වත්කම් නිවැරදිව හදුනාගෙන ගිණුම් ගත කළ යුතුවීම. | ඉදිරියේදී මෙම මුදල කාර්යාලීය හා උපකරණ ආරම්භක ශේෂයෙන් ඉවත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**1.6.3 විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මගී වාහන වටිනාකම රු.මිලියන 827.76 ක් තහවුරු කෙරෙන පරිදි 2018 දෙසැම්බර් 31 දිනට භෞතික සමීක්ෂණ වාර්තා ඉදිරිපත් නොකෙරුණි. | මගී වාහන වාර්ෂිකව භෞතිකව සමීක්ෂණය කළ යුතුවීම. | රාජකාරී බහුලත්වය මත වාහන සමීක්ෂණය සඳහා එක් දිනක් වාහන එක් තැනක ගාල් කර තැබීමට අපහසුවී ඇති බව. |
| (ආ) | තරුණ කටයුතු අංශයට අදාලව රු.මිලියන 21.47 ක් හා නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයට අදාලව රු.මිලියන 15.77ක වත්කම් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ දක්වා තිබුණද, ඊට අදාල විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකෙරුණි | විස්තරාත්මක උපලේඛන පවත්වාගෙන යායුතු වීම. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන සහ මූලධන වියදම් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් එම ප්‍රතිපාදන උපයෝජනයෙන් පසු ඉතිරිය පිළිවෙලින් සියයට 13.65 ක් හා සියයට 59.43 ක් විය. | වියදම් ඇස්තමේන්තු හැකිතාක් තාත්වික ලෙස පිළියෙල කළ යුතුවීම. | 2018 වර්ෂයේ ඔක්තෝබර් මස පාර්ලිමේන්තුව විසුරුවා හැරීමත් සමඟම එම කාලය තුල ව්‍යාපෘතිවලට අදාල පුනරාවර්තන වියදම් සිදුනොවුනු බව |
| (ආ) | පුනරාවර්තන වැය විෂයයන් දෙකකට සලසාගෙන තිබුණු රු.මිලියන 3 ක් වූ මුළු ප්‍රතිපාදනයම වෙනත් වැය විෂයයකට මාරු කර තිබුණි. | වියදම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතුවීම. | අපේක්ෂිත වියදම් සිදු නොවුන බැවින් භාණ්ඩාගාර අවසරය මත අවශ්‍ය වැය සම්මත සඳහා ප්‍රතිපාදන මාරු කර වියදම් දැරීමට කටයුතු කර ඇති බව. |
| (ඇ) | වැය විෂයයන් 22 කට අදාලව වෙන්කළ රු.බිලියන 16.5 ක ප්‍රතිපාදනයට අමතරව පරිපූරක | - එම - | පුහුණු වන උපාධිධාරීන් බඳවා ගැනීම හා ඔවුන්ට අදාල දීමනාව හා පාර්ලිමේන්තු නියෝජිතවරුන් |

| | | |
|---|---|---|
| ප්‍රතිපාදන මගින් රු.බිලියන 4.6 ක ප්‍රතිපාදන ලබාගෙන තිබුණු අතර එම වටිනාකම අයවැයගත ප්‍රතිපාදනයට සාපේක්ෂව සියයට 5 සිට සියයට 621 දක්වා පරාසයක පැවතුණි. | | සඳහා අමාත්‍යාංශයේ වාහනවල වාර සේවාව හා අලුත්වැඩියා වැය හා අමාත්‍යාංශය නව ගොඩනැගිල්ලකට පිවිසීම හා ඒ සඳහා අවුරුදු 02ක බදු කුලී අත්තිකාරම් ගෙවීම. |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

-----------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවය හැර ගිය නිලධාරීන්ගේ රු.852,241 ක්, වැඩ තහනම් කළ නිලධාරීන්ගේ රු.132,622 ක්, විශ්‍රාමගිය නිලධාරීන්ගේ රු.319,030 ක්, මියගිය නිලධාරියකුගේ රු.11,810 ක්, වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරුවීම් ලැබූ නිලධාරීන්ගේ රු.915,551 ක් හා වැටුප් රහිත නිවාඩු ලැබූ නිලධාරීන්ගේ රු.1,076,581 ක් වූ ණය ශේෂ නිරවුල් කර නොතිබුණු අතර එම ශේෂ වර්ෂ 05 ඉක්මවා තිබුණි. | ණය ශේෂයන් නිරවුල් කර ගැනිමට කඩිනමින් කටයුතු කළ යුතුවීම. | මෙම නිලධාරීන් පිළිබඳ සම්පූර්ණ තොරතුරු එම අමාත්‍යාංශයේ නොතිබීම නිසා ණය පවරා දෙන අවස්ථාවේදී මෙම අමාත්‍යාංශය එම තොරතුරු ලබා දී නොමැති බව. |

## 2.3 තැන්පත් ශේෂයන්

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2015 ජුලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015 (04) ප්‍රකාරව එකතු කරනු ලබන එක් එක් මාසය අවසානයේදී තැන්පතු ගිණුමේ පවතින ශේෂය එළැඹෙන මාසයේ පළමු සතිය තුල ඒ ඒ ආදායම් විෂය යටතට ගත යුතු වුවත් නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයට අදාල ආදායමින් රු.2,916,832 ක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් තැන්පතු ගිණුමක පැවතුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඇඹිලිපිටිය නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයේ බාහිර වැඩසටහන්වලට අදාලව රු.10,480 ක් 2019 පෙබරවාරි මාසයේදී අදාල පාර්ශවයන් වෙත ගෙවීමට කටයුතු කළ අතර රු.2,906,352 ක මුදල රජයේ ආදායමට බැර කළ බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2018 වර්ෂයේ දී ඇප තැන්පතු ලෙස රු.මිලියන 5.26 ක් හා කුලී අත්තිකාරම් ලෙස රු.මිලියන 21ක් ගෙවා තිබුණ ද අදාල චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව ගිණුම්ගතකර තිබුණි. එසේම 2018 වර්ෂයට පෙර සිදුකරන ලද ගෙවීම් හදුනාගෙන ගිණුම්ගත කිරීමට පියවර ගෙන නොතිබුණි. | - එම - | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 250/2016 **(i)**හි (1) ඡේදය පරිදි අත්තිකාරම් ගෙවීමේදී එම සම්පූර්ණ මුදලම වැය විෂය අංක 1404 ට හර කර ගෙවා ඇති බව. |
| (ඇ) | යොවුන් සේනාංක මධ්‍යස්ථාන ඉදිකිරීම් කටයුතුවලට අදාල රඳවාගැනීම් රු.මිලියන 77 ක් වර්ෂයකට වැඩි කාලයක සිට තැන්පත් ගිණුමක රඳවාගෙන තිබුණි. | මධ්‍යස්ථාන ඉදිකිරීම් කටයුතු කඩිනම් කරවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවීම. | අදාල ශේෂය 2018 දෙසැම්බර් 31 වන විට වසර 02 ක කාලය ඉක්මවා නොමැති බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විශේෂ සංවර්ධන ව්‍යාපෘති 15 ක් වෙනුවෙන් රු.මිලියන 41,768 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද එහි මූල්‍ය ප්‍රගතිය සියයට 45 ක් පමණක් විය. එයින් ව්‍යාපෘති 9 ක භෞතික ප්‍රගතිය සියයට 58 කට වඩා අඩු මට්ටමක පැවතිණි. | වියදම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කල යුතු අතර ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුවීම. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

## 3.2 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යාංශය සතු වාහන 23 ක් අමාත්‍යාංශයේ අරමුණුවලට පටහැනි ව්‍යාපෘති අධීක්ෂණ කටයුතු වෙනුවෙන් භාවිතා කර තිබුණු අතර එම වාහනවලට අදාලව සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 8.7 ක් වැයකර තිබුණි | අමාත්‍යාංශ සම්පත් අමාත්‍යාංශයේ අරමුණුවලට අදාලව යෙදවිය යුතුවීම. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

### 3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අයවැය ඇස්තමේන්තුව යටතේ ලඟාකර ගත යුතු ආර්ථික ඉලක්කයන් වූ ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදනය, මූර්ත දළ ජාතික නිෂ්පාදනය, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් මුළු ආයෝජන, දේශීය ඉතුරුම්, යනාදිය ලඟාකරගෙන නොතිබුණි. | ආර්ථික ඉලක්කය ලඟාකරගත හැකිවන පරිදි අමාත්‍යාංශයේ කාර්යභාරය සැලසුම් කළ යුතුවීම. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

### 3.4 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අභ්‍යාසලාභී උපාධිධාරීන්ගේ දීමනා ලෙස 2018 වර්ෂයේ දී රු.මිලියන 199.18 ක් වැයකර තිබුණු නමුත් බඳවාගැනීම් සඳහා ඉදිරිපත් කර තිබූ නිර්නායක හා ලකුණු අභ්‍යාසලාභී යෝජනා ක්‍රමයේ අපේක්ෂා ඉටුවන පරිදි සකස්කර නොතිබුණි. අභ්‍යාසලාභීන් සඳහා විධිමත් පුහුණුකිරීමේ වැඩසටහන්ද සම්පාදනය කර නොතිබුණි. තවද, එම බඳවාගැනිම්වලට අදාල තොරතුරු හා ලේඛන ඉදිරිපත් නොකෙරුණි. | අභ්‍යාසලාභී උපාධිධාරීන් බඳවාගැනිමට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සම්පාදනය විධිමත් කළ යුතුවීම. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

### 3.5 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකාවේ කඩිනම් ආර්ථික පරිවර්තනයක් ඇති කරලීමේ අරමුණින් ආරම්භ කරන ලද මධ්‍යම වැඩසටහන් කළමනාකරණ ඒකකයේ සමස්ථ ප්‍රගතිය දැක්වෙන වාර්තා පිළියෙල කර නොතිබුණි. පසුගිය වර්ෂ 03 සඳහා අපේක්ෂිත කාර්යසාධනය හා ඉලක්ක දැක්වෙන වාර්තාද සකස් කර නොතිබුණි. තවද, එම | අපේක්ෂිත කාර්ය සාධනය හා ඉලක්ක දැක්වෙන වාර්තා සකස් කළ යුතුවීම. | අපේක්ෂිත කාර්ය සාධනය හා ඉලක්ක දැක්වෙන වාර්තාවක් ඉදිරි කාල පරිච්ජේදය සඳහා සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. |

ඒකකය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 34.86 ක් ප්‍රතිපාදන සලසා තිබුණද එයින් සියයට 80 ක් උපයෝජනය කර නොතිබුණි.

**3.6 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අමාත්‍යාංශයට අයත් කාර්යභාරයෙන් විෂයයන් 9 ක් අඩුකර තිබියදීත් ඊට අදාල ලෙස රියදුරු තනතුරු හා වාහන සංඛ්‍යාව සංශෝධනය කර නොතිබුණි. | අමාත්‍යාංශ කාර්යයන්ගේ සිදුවන වෙනස්කම්වලට අනුරූප වන පරිදි සම්පත් බෙදාහැරීම කළ යුතුවීම. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ආ) 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව වාහන සඳහා වෙන් කළ ප්‍රතිපාදනවල විශේෂ ඉතිරියක් නිරීක්ෂණය නොවූ අතර සංචිත වාහන 15 කට හා වෙන්කළ වාහන 3 කට පමණක් ඉන්ධන සපයා ඇති බව විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව තහවුරු විය. ඒ අනුව රු.මිලියන 533.7ක් වටිනා වාහන 73 කින් සමන්විත වාහන ඇණිය ඵලදායීව කළමනාකරණය කර නොතිබුණි. | වාහන ඇණිය ඵලදායීව කළමනාකරණය කිරීමේ අභ්‍යන්තර පාලනයන් සකස්කළ යුතුවීම. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

**3.7 රජයේ නිලධාරීන් ඇප තැබීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 සඳහන් විධි විධාන ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප තබා නොතිබුණි. | මුදල් රෙගුලාසි විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

**3.8 කළමනාකරණ දුර්වලතා**

**-------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයට අයත් නිල නිවාස 21 ක් වෙනුවෙන් 2013 වර්ෂයේදී තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබාගත් ආර්ථික කුළිය පදනම් කරගෙන මාසික කුළිය අයකර තිබුණු අතර නව තක්සේරුවක් මත කුළිය සංශෝධන කිරිමට කටයුතු කර නොතිබුණි. තවද, නිල නිවාස 03 ක් භාවිතා කර නොතිබුණු අතර නිල නිවාස 02 ක භාවිතය පිළිබඳ තොරතුරු ලබාදී නොතිබුණි. නිල නිවාසලාභීන් සඳහා නිවාස ලබාදීමේදි විධිමත් අනුමැතියක් හෝ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. | නිල නිවාස කුළී පදනමින් ලබාදීමේ කටයුතු විධිමත් කළ යුතුවිම. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

**--------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| 2018 වාර්ෂික ඇස්තමේන්තුවේ ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති 06 ක් යටතේ තිරසර සංවර්ධන අරමුණුවලට අදාළ ඉලක්ක දක්වා ද තිබුණ ද එම ඉලක්ක ළඟා කරගැනීමට අදාළ නිවැරදි දත්ත ලබාගෙන තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතිය පිළිබඳව තොරතුරු කාර්යසාධන වාර්තාව මඟින් හෙළිදරව් කර නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක සපුරාලීම සඳහා කටයුතු කළ යුතුවීම. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

## 5. යහපාලනය

### 5.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යාංශය තුල මහජන පැමිණිලි භාර ගැනීම සඳහා පැමිණිලි පෙට්ටියක් භාවිතා නොකරන අතර පැමිණිලි ලේඛනගත කර ප්‍රගතිය පිළිබඳ සමාලෝචනය කර නොතිබුණි. එසේම අමාත්‍යාංශ වෙබ් අඩවිය මඟින්ද මහජන පැමිණිලි භාර ගැනීමේ ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි. | මහජන පැමිණිලි භාර ගැනීමට ක්‍රමවේදයක් සකස්කළ යුතුවීම. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

### 5.2 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂය සඳහා අනුමත කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව ප්‍රධාන කාර්යයන් 16 ක් ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණි. ඉන් ධාරිතා සංවර්ධනය, කාර්යසාධනය ඇගයීම සහ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම යන ප්‍රධාන කාර්යයන් ඉටුකර නොතිබුණි. | සැලසුම් කළ පරිදි විගණන කටයුතු ක්‍රියාත්මක කළ යුතුවීම. | කාලීනව සිදුවූ දේශපාලන වෙනස් වීම් මත ඇතිවූ අස්ථාවර තත්වයන් හා කාර්යාල පරිශ්‍රය වෙනස් වීම නිසා ධාරිතා සංවර්ධන කාර්යයන් සැලසුම් කළ පරිදි ඉටු කිරීමට නොහැකි වූ බව. |

### 5.3 විගණන හා කළමනාකරණ කමිටුව

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03 ක් පමණක් පවත්වා තිබුණි. | අවම වශයෙන් රැස්වීම් හතරක් පැවැත්විමට කටයුතු කළ යුතුවීම. | සැලසුම් කළ පරිදී සිව්වන රැස්වීම පැවැත්වීමට නොහැකි වූ බව. |

**6. මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයෙහි පුරප්පාඩු 60 ක් පැවතියද වාර්ෂික ඒක පුද්ගල වියදම 2017 වර්ෂයට සාපේක්ෂව සියයට 52 කින් වර්ධනය වී තිබුණි. | පුරප්පාඩු පැවතිම මගින් අමාත්‍යාංශයයේ කාර්ය සාධනයට ඇතිවන බලපෑම අනුව පුරප්පාඩු පිරවීමට හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුවීම. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ආ) | කාර්ය මණ්ඩල පුහුණු අවශ්‍යතා සඳහා රු.මිලියන 10 ක ප්‍රතිපාදන සලසා තිබුණද 2018 දෙසැම්බර් 31 දිනට එහි මූල්‍ය ප්‍රගතිය සියයට 21 ක් විය. එමෙන්ම 2018 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්ය මණ්ඩල පුහුණු අවශ්‍යතා ප්‍රධාන ක්‍රියාකාරකමක් ලෙස දක්වා තිබුණද, එහි කාර්යසාධන ප්‍රගතිය ඉදිරිපත් නොකෙරුණි. | වාර්ෂික කාර්ය මණ්ඩල පුහුණු අවශ්‍යතා හඳුනාගෙන ප්‍රතිපාදන සලසා ගැනිමට කටයුතු කළ යුතුවීම. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |